28)

# කණිෂ්ඨ ද්විතීයික පාසැල් සම්පූර්ණ කරන සිසුන් තුළ සමාජ අධ්‍යයන පාඨමාලාව මගින් ඇතිකර ලීමට අපේක්ෂා කරන ආර්ථික විද්‍යාත්මක සංකල්ප කෙතෙක් දුරට සාධනය වී ඇත්දැයි කළුතර දිස්ත්‍රික්කය ඇසුරින් කරනු ලබන තුලනාත්මක අධ්‍යයනයක්.

1983 අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය.

M.Phil. 13 ( 1980 )

UCLIB
386981

කථිකාචාර්ය. එස්. රූපසිංහ.

පී. ඩී. ජයරත්න,
බී. ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය.

1983 ජූලි 15 දින.

386981

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

## සංක්ෂේපයෙන්.

මැතක් වන තුරු ම පැවති යටත් විජිත අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පිළියෙල වූ අධ්‍යාපනය මගින් ලංකාවේ විවිධාකාර වූ බෙදීම්, වර්ග කිරීම්-වලට පාත්‍ර වූ සමාජයක් බිහි විය. යටත් විජිත අධ්‍යාපනය ලැබූ ඇතැම් කොටස් ඉන් තමන් ලත් වරප්‍රසාද, නිල නාම ආරක්ෂා කර ගැනීමට උත්සාහ කිරීමෙන් සිදු වූයේ අප නිදහස ලබා ගත් පසුත්, යටත් විජිත ආකල්ප හා අගයයන් සමාජයෙන් තුරන් නොවීමයි. ප්‍රතිසංස්කරණ වාදීන් සමග සසඳන විට වරප්‍රසාද ආරක්ෂා කිරීමට උත්සාහ ගත් අයගේ ශක්තිය විශාල වූ බව පෙනේ. එහි ප්‍රතිඵලය වූයේ සංවර්ධනය වන රටකට අවශ්‍ය ජාතික අධ්‍යාපනයක් ඒකා-කාරීව දිවයින තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමයි. ජාතික මුහුණුවරක් ගත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට ගත් උත්සාහයන්හි ප්‍රතිඵල වශයෙන් පොදු අධ්‍යාපනයක් දිවයින තුළ ව්‍යාප්තවීම, අකුරු හැකියාව දියුණුවීම, විෂයමාලා සංශෝධනය වීම, විශාල අධ්‍යාපන පිරිවැයක් වෙන් කිරීම හා තරමක් දුරටවත් සම අධ්‍යාපන අවස්ථා ගැන සැලකිලිමත් වීම වැනි ලක්ෂණ ඇති විය. නමුත් එම ක්‍රියාමාර්ග එතරම් ප්‍රමාණවත් නොවන බව නිතර නිතර මතුවන උද්ඝෝෂණ-වලින් පෙනී යයි.

පොදු විෂය මාලාවක් මගින් ලබා දෙන අධ්‍යාපන සංකල්ප විවිධ අවස්ථා-වල දී පොදු විභාග මගින් අගයනු ලැබීමේ දී පෙනී ගියේ විවිධ සාධකවල බලපෑම නිසා සාධනය විවිධාකාර වන බවය. විශාල අධ්‍යාපන පිරිවැයක් වෙන්කර දීත්, ඇතැම් ප්‍රදේශවල අපේක්ෂිත සාධන මට්ටම් නොලැබී යයි. නොයෙක් උද්ඝෝෂණ-වලට පදනම් වූයේ මෙම තත්ත්වයන් බව පෙනේ.

පොදු අධ්‍යාපනයක් සැපයුවත් දිවයිනේ පලාත් දෙකක් අතර අධ්‍යාපන පහසුකම්වල විශාල වෙනසක් ඇත. ගම්බද ප්‍රදේශවලට වඩා නාගරික අධ්‍යාපන තත්ත්වය දියුණු වී ඇත. ගුරුවරු, උපකරණ, ගොඩනැගිලි හා සැලකිලි නාගරික පාසල්වලට වායිවන අයුරින් ලැබේ. එහි ප්‍රතිඵල වී ඇත්තේ ගම හා නගරය තව තවත් ඈත් වීමයි. එමනිසා ම ඔවුනොවුන්ගේ සමාජ පංති පදනම වඩාත් තහවුරු වන අතර, අධ්‍යාපන සාධනය කෙරේ සමාජ පංතියේ බලපෑම තව තවත් වැඩි වෙයි.

මීට අමතර ව නොයෙක් සාධක, සාධනය කෙරේ බලපාන බව ලංකාවෙහි ම කරන ලද විවිධ අධ්‍යයන මගින් හෙළි වී ඇත. නිතර නිතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කෙරෙන මෙවැනි කාලයක මෙම සාධකවල බලපෑම කොතෙක් ද? එමනිසා පාසලින් පිටවන දරුවාට සමාජයේ පරිපූර්ණ පුද්ගලයකු සඳහා අවශ්‍ය සංකල්ප ලැබෙන්නේ ද යන්න සොයා බැලීම අවශ්‍ය වන්නේය.

ඒ අනුව ගම්බද, නාගරික වෙනස ශිෂ්‍යයාගේ සමාජ ආර්ථික පරිසරයෙහි වෙනස, ස්ත්‍රී පුරුෂ වෙනස හා උගන්වන ගුරුවරයාගේ අධ්‍යාපනික සුදුසුකම්වල වෙනස සාධනය කෙරේ බලපාන්නේ දැයි මෙම අධ්‍යයනයෙහි දී සොයා බලන ලදී. මෙය කරන ලද්දේ 10 ශ්‍රේණිය අවසානයෙහි දී සමාජ අධ්‍යයන විෂයයෙහි ඇතුළත් ආර්ථික විද්‍යාත්මක සංකල්ප සාධනය මිනුමට ලක් කිරීමෙනි. කළුතර දිස්ත්‍රික්කයේ රජයේ සිංහල මාධ්‍ය පාසැල්වල 10 ශ්‍රේණියේ සිසුන් 1200 ක් මේ සඳහා නියදිය වශයෙන් ගෙන ඇත. මෙහි දී ගම්බද, නාගරික වෙනස, සමාජාර්ථික පරිසරයේ වෙනස හා ගුරුවරුන්ගේ හැකියා අනුව වෙනස්කම් සාධනය කෙරෙහි බලපාන බව හෙළි විය. එසේ ම සාමාන්‍ය සාධන මට්ටම තරා බොහෝ දෙනෙකු නොපැමිණීමෙන් පෙනී ගියේ වැය කරන අධ්‍යාපන පිරිවැය සඵලදායක ප්‍රතිඵල ඇති කිරීමට සමත් නොවූ බවය.

නිතර නිතර සමාජයේ ඉදිරිපත් වූ උද්ඝෝෂන පදනම් සහිත බව මෙම අධ්‍යයනයෙහි දී පෙනී යයි. එසේ ම යටත් විජිත අධ්‍යාපන ලක්ෂණවලින් තවමත් අපේ ක්‍රියාවලිය ඉවත් වී නොමැති බව ද පෙනේ. සම අධ්‍යාපන අවස්ථා සිහිනයක් පමණක් වී ඇත. එමනිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී සලකා බැලිය යුතු යෝජනා කීපයක් ද ගොඩනගා ගැනීමට මෙහි නිගමන තුළින් හැකි විය.

මෙම අධ්‍යයනයෙහි පළමුවන පරිච්ඡේදයේදී සමාජ අධ්‍යයනය සහ පුද්ගල සංවර්ධනය ගැනත් සමාජ අධ්‍යයන විෂයෙන් ලබා දෙන ආර්ථික විද්‍යාත්මක සංකල්ප ගැනත් විමසා ඇත. දෙවන පරිච්ඡේදයේදී 1943 විශේෂ කාරක සභා යෝජනා ඉදිරිපත්වීමේ සිට මේ දක්වා ලංකාවෙහි අධ්‍යාපනික පසුබිම සැකවින් ඉදිරිපත් කෙරේ. පර්යේෂණය හා බැඳුනු අදාල සාහිත්‍ය තුන්වන පරිච්ඡේදයෙන් ඉදිරිපත්වන අතර සිව්වන පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ අරමුණු පරීක්ෂා කෙරෙන අභ්‍යුපන්‍යාස, නියැදිය, මිනුම් උපකරණ හා පර්යේෂණය මෙහෙය- වූ ආකාරය ඇතුළත් පර්යේෂණ සැලැස්ම පැහැදිලි කර ඇත. පස්වන පරිච්ඡේ- දයෙන් දත්ත විශ්ලේෂණ තොරතුරු පෙන්වන අතර 6 වන පරිච්ඡේදයේදී දත්ත අර්ථකතනය කර ඇත. අධ්‍යයනයෙන් ලැබූ නිගමන හා ඒ අනුව ගොඩනැගූ යෝජනා 7 වන පරිච්ඡේදයේ දැක්වෙයි.